**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (II)**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර සමත් විය යුතු තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 ජූලි** මස මහනුවර දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පිළිබඳ විස්තරය - 2013.12.13 දිනැති අංක 1840/51 දරණ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ විධිවිධාන අනුව එහි පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

**විභාගය පිළිබඳ විස්තර :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| කළමනාකරණය | 01 කළමනාකරණ මූලධර්ම<br>02 කළමනාකරණ ශ්‍රිතයන්<br>03 කළමනාකරණ පරිසරය<br>04 සහභාගිත්ව කළමනාකරණය<br>05 මහජන සම්බන්ධතා<br>06 යහ පාලනය<br>07 ආචාර ධර්ම |

04. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම් කිරීමේදී ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

05. අයදුම් පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම භාවිතා කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතු වේ. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම තම අත් අකුරින්ම පැහැදිලිව කළ යුතු වේ.

06. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම පරීක්ෂා කොට තහවුරු කර ගත යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සටහන් කළ යුතු ය.

07. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව උක්ත සඳහන් විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති මෙම විභාගය සඳහා ද අදාළ වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

08. ඉල්ලුම් පත්‍ර **2026.06.30** වන දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානි මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් සඳහා කිසිදු විභාග ගාස්තුවක් අය නොකෙරේ. එතකුදු වුව ද දෙවන වර හෝ ඊට වැඩි වාර ගණනක් පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ගාස්තු ලෙස රු.600/= ක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමින් 2003-99-00 යන දෙපාර්තමේන්තු ශීර්ෂයට බැරවන සේ දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපත හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් නමින් පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 057100179027275 දරන ගිණුමට දිවයිනේ ඕනෑම මහජන බැංකුවකින් මුදල් බැර කිරීමෙන් ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එක් දාරයකින් ඇලවිය යුතු ය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීමද ප්‍රයෝජනවත් විය හැක. කිසිදු හේතුවක් නිසා මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

10. විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් විභාග අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර එම මුදල ගෙවා ඊට අදාළ ලදුපත ද සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය සඳහන් කොට අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කළ යුතු ය. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

11. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊ මේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතු ය. අවශ්‍ය වුවහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි ඡායා පිටපතක් සහ අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන කිසිදු ලියවිල්ලක් සළකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. ඉල්ලුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය බී.එස්.එස්. පෙරේරා,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.).

2026 මැයි මස 19 දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.